# ලංකා ඉතිහාසය

## 6 ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා



e තක්සලාව
The National e-learning Portal for The General Education
Start Your Learning Journey with e-thaksalawa

නිපුණතාව – 6

නිපුණතා මට්ටම – 6 ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳව අවබෝධයෙන් කටයුතු කරයි.

නිපුණතා මට්ටම – 6.1 ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරය මුල් පදනමෙන් වෙනස් වූ යුගයක් වෙත පිවිසීම හා එහි ක්‍රියාකාරිත්වය විමර්ශනය කරයි.

ඉගෙනුම් ඵල –
* පොළොන්නරු යුගයෙන් පසු බිහි වූ රාජධානි හඳුනා ගනී.
* රජරට රාජධානි සහ පොළොන්නරු යුගයෙන් පසු බිහි වූ රාජධානි අතර වෙනස පහදයි.
* පොළොන්නරු යුගයෙන් පසු බිහි වූ රාජධානි සිතියමක ලකුණු කරයි.

## නිපුණතාව – 6.1

### රජරට ශිෂ්ටාචාරයෙන් පසු අවධිය

මෙම නිපුණතාව අධ්‍යයනය කිරීමෙන් ඔබට පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට හැකියාව ලැබේ.

1.) රජරට ශිෂ්ටාචාරයෙන් පසු බිහි වූ ප්‍රාදේශීය පාලන මධ්‍යස්ථාන හා ඒවායේ පාලකයන් කවුරුන් ද?

2.) දඹදෙණිය රාජධානියේ ශ්‍රේෂ්ඨ පාලකයන් හා ඔවුන්ගෙන් සිදු වූ සේවාවන් මොනවා ද?

3.) යාපහුව හා කුරුණෑගල රාජධානිවල වැදගත් පාලකයන් , දේශපාලන හා සාහිත්‍යමය වැදගත්කම පැහැදිලි කරන්න.

4.) ගම්පොළ රාජධානියේ වැදගත් පාලකයන් සහ ප්‍රභූ පවුල් මොනවා ද?


අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- දිනුෂා හර්ෂණි මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂාව :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය. සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය -නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

නිපුණතාව -6

## රජරට ශිෂ්ටාචාරයෙන් පසු අවධිය


වර්ෂ 1215 කාලිංස මාඝගේ ආක්‍රමණයත් සමඟ පොළොන්නරුවේ අවසාන දේශිය පාලකයා වූ පරාක්‍රම පාණ්ඩ්‍යගේ රාජ්‍ය කාලය අවසන් විය. කාලිංස මාඝ විසින් පොළොන්නරුව අවටත්, රජරට හා වයඹදිග ප්‍රදේශත්, මන්නාරම වැනි ප්‍රදේශයන්හි දීත් සිය සෘජු බලය පිහිටවන ලදී. මාඝගේ මෙම බිහිසුණු ක්‍රියා කලාප නිසා අසරණ තත්ත්වයට පත් රජරට කුමාරවරුන් සහ සෙසු ජන ප්‍රධානීන් රැකවරණ පතා රුහුණට හා මායා රටට සංක්‍රමණය විය. ඔවුන්ගෙන් සමහරෙක් ඒවායේ වූ වන දුර්ග , ගිරි දුර්ග ආදී වූ ආරක්ෂිත ස්ථානවල නගර ඉදිකර අවට ප්‍රදේශ පාලනය කළහ. එලෙස ප්‍රාදේශිය පාලන මධ්‍යස්ථාන පිහිටුවා ගත් සිව් දෙනෙකු පිළිබඳ මහා වංශයේ සඳහන් වේ. එනම් ,




අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- දිනුෂා හර්ෂණී මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂාව :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය. සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය -නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

මොවුහු සීමිත ප්‍රදේශවල ආධිපත්‍යය ගොඩ නගා ගෙන ජනතාවට හා බුදු සසුනට ද රැකවරණය සලසා දීමට කටයුතු කළහ. මාඝ සතු වූ අති ප්‍රබල යුද්ධ සංවිධානය හා සසඳන කල රජරට නිදහස් කර ගැනීමේ සටනකට පිවිසීමට තරම් ශක්තියක් ඔවුනට නොතිබුණි. එමෙන් ම ඒ සඳහා සාමූහික ප්‍රයත්නයක යෙදුණු බවක් ද දක්නට නොමැත. ඔවුන් සතු වූ සීමිත සේනා බලය ගැන සිතන විට එවැනි ප්‍රයත්නයක යෙදුන ද එය සාර්ථක කර ගැනීමට තිබූ අවකාශය ද අල්ප වූ බව පෙනේ. එහෙත් ඔවුන්ගේ බල ප්‍රදේශවල විසූ ජනතාවට හා බුදු සසුනට ද රැකවරණ සපයා දීම සඳහා ඔවුන් දැරූ ප්‍රයත්නය වඩාත් ප්‍රශංසනීය වේ.







Copyright © www.e-thaksalawa.moe.gov.lk

## 6.1 පාලන මධ්‍යස්ථාන

### දඹදෙණිය රාජධානිය






### තුන්වන විජයබාහු රජු (ක්‍රි.ව 1232 - 1236)

මෙකල දිවයිනේ සමස්ත දේශපාලන පසුබිම පිළිබඳව සැලකූ විට රජරට මාඝගේ ආධිපත්‍යය යටතේ පැවති බවත් , රුහුණු රට හා මායා රට තැනින් තැන කුඩා බල ප්‍රදේශ පිහිටුවා ගත් ප්‍රාදේශීය නායකයන් මගින් පාලනය කරනු ලැබූ බවත් පෙනේ. මෙම ප්‍රාදේශිය පාලකයන් අතරින් මායා රට පාලනය කරනු ලැබූ නායකයා අනෙකුත් ප්‍රාදේශීය නායකයන් අභිභවා ක්‍රි.ව . 1232 දී තුන්වන විජයබාහු නමින් දඹදෙණියේ රජ විය.

මෙතුමා පිළිබඳ ව තොරතුරු හැදෑරීම සඳහා මහාවංශය , පූජාවලිය , රාජරත්නාකාරය , චූලවංශය වැනි මූලාශ්‍ර වැදගත් වේ.

- චූලවංශයට අනුව ශ්‍රී මහා බෝධි ශාඛාව ලක්දිවට වැඩම කළ සිරි සංඝබෝධි පරම්පරාවට මෙතුමා අයත් බව සඳහන් වේ.
- රාජරත්නාකරයෙහි දැක්වෙන කරුණුවලට අනුව මොහු කාලිංඝ වංශිකයෙකි.
- ඇතැම් සෙල්ලිපිවල මොහු පාණ්ඩ්‍ය වංශයට අයත් බව දැක්වේ.
- ඇතැම් වංශ කතාවලට අනුව මෙතුමා දිවයිනේ ප්‍රධාන රාජවංශ පරාම්පරාවක පුරුක ලෙස දක්වා තිබේ.

Copyright © www.e-thaksalawa.moe.gov.lk



Copyright © www.e-thaksalawa.moe.gov.lk

සමකාලීන මූලාශ්‍රයවල විජයබාහු හඳුන්වා ඇත්තේ වන්නි රජු හෙවත් වන්නි නිරිඳු යනුවෙනි. ඉන් අදහස් වන්නේ කිසියම් වනගත ප්‍රදේශයක ආධිපත්‍ය පිහිටුවා ගත් ප්‍රාදේශීය නායකයකු බවයි. වංශ කතාවලට අනුව ඔහු සතුරාට බියෙන් විවිධ වන දුර්ගවල සැඟවී දීර්ඝ කාලයක් වාසය කර ඇත.විජයබාහුගේ යොවුන් විය එපරිද්දෙන් ගෙවී ගිය ද ඉතා දීර්ඝ කාලයක් වන්නි රජකුගේ තත්ත්වයේ සිට පසුව මායා රටේ හෙවත් දක්ඛිණ දේශයේ ආධිපත්‍යය ලබා ගැනීමට හැකිවීම ඓතිහාසික වශයෙන් ඉතා වැදගත් වේ.මෙහි දී සමකාලීනව සිටි අනෙක් ප්‍රාදේශීය නායකයන් උපාය බලයෙන් අවනත කර ගැනීමට හෝ ඔවුන්ගේ බලය මර්දනය කර ගැනීමට විජයබාහු සමත් වූ බව පෙනේ.



මේ වන විට මායා රටෙහි පවා දමිළ ජනපද පිහිටුවා ගෙන තිබූ බව ඇතැම් මූලාශ්‍රයවල දැක්වේ. විජයබාහු රජු මාඝගේ හමුදා පොළොන්නරුව දක්වා පලවා හැර මායා රට එක්සත් කොට දේශපාලන ස්ථාවරත්වයක් ගොඩනගා එහි පාලකයා බවට පත් වූ බව එම මූලාශ්‍රයවල දැක්වේ.

මායා රටේ අධිපතියා වූ විජයබාහු රජු තම අගනුවර පිහිටුවා ගන්නේ කුරුණෑගලට සැතපුම් 18 ක් නිරිත දිගින් පිහිටි දඹදෙණියේ ය (ජම්බුද්‍රෝණි) . මෙය මාඝගේ ආධිපත්‍යය පැතිරුණු පොළොන්නරුවට සැතපුම් 75 ක් පමණ ඈතින් පිහිටා ඇත. ප්‍රදේශයෙන් තරමක් උසට නැඟුණු කඳු ගැටයක ස්වරූපයක් ගත් මෙම ප්‍රදේශයෙහි එම ස්වාභාවික රැකවරණයට අමතරව පවුරු පදනම් හා දිය අගල් ආදියෙන් යුක්ත ආරක්ෂිත මධ්‍යස්ථානයක් බවට පත් කරන ලදී. අනාගතයේදී මාඝ නෙරපා හැරීම සඳහා කරනු ලබන සටනක දී සතුරු බලවේගවලට එරෙහිව නැඟී සිටිය හැකි මූලස්ථානයක් බවට මෙම ප්‍රදේශය පත් කිරීමට මෙම රජු සමත් විය.

දඹදෙණි යුගයේ දී බුදු දහම නගා සිටුවීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කළ නරපතියෙකු ලෙස ද මෙතුමා වැදගත් වේ.

*මෙතුමා බුදු දහම නගා සිටුවීම සඳහා කරන ලද කාර්ය අතර ,*



- කොත්මලේ ප්‍රදේශයේ සඟවා තිබූ දන්ත දාතුන් වහන්සේ සහ පාත්‍රා ධාතුව බෙලිගලට වැඩමවා දළදා මැඳුරක් තනවා එහි තැන්පත් කිරීම.

මායා රටෙහි විජයබාහු රජුගේ ආධිපත්‍යය ශක්තිමත් වීමට දන්ත ධාතුව හා පාත්‍රා ධාතුව එතුමා සතු වීම මහත් රුකුලක් විය. මාඝ රජරට විනාශ කළ අවධියේ දී එකල වැඩ විසූ මහ තෙරවරු පොළොන්නරුවේ තැන්පත් කර තිබූ දන්ත ධාතුව හා පාත්‍රා ධාතුව ආරක්ෂාව සඳහා කොත්මලයට ගෙන ගොස් නිදන් කර තැබූහ. මහා සංඝයා වහන්සේලාගේ ආරාධනා අනුශාසනා ඇතිව එම පූජ්‍ය වස්තු නැවත ලබා ගෙන දඹදෙණියට වැඩමවා ඉතා ආරක්ෂිත ස්ථානයක් වූ බෙලිගල පර්වත මුදුනෙහි දළදා මාළිගාවක් තනා එහි තැන්පත් කරනු ලැබිණි.මේ අවධිය වන විට රජවරුන්ට සිංහාසන උරුමය තහවුරු වීමට දන්ත ධාතුන් වහන්සේගේ භාරකාරත්වය හිමිවීම අත්‍යවශ්‍ය විය. දන්ත ධාතුන් වහන්සේ බෙලිගල දළදා මැඳුරේ තැන්පත් කිරීම නිසා ගිහි පැවිදි දෙපක්ෂයේ ම ගෞරවය විජයබාහු රජුට හිමි විය. එමෙන් ම යම් හෙයකින් ඔහුට පාරම්පරික රාජ්‍ය උරුමයක් නොතිබුණේ නම් එම අඩුව ද පිරිමැසී එමගින් ඔහු මායා රටේ පිළිගත් පාලකයා බවට පත් වූ බව පෙනේ.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- දිනුෂා හර්ෂණී මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂාව :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය. සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය -නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

- දඹදෙණියේ විජයසුන්දරාරාමය , වත්තල විජයබාහු විහාරය සහ අත්තනගල්ල , තොටගමුව ආදී ප්‍රදේශවල විහාර ආරාම කරවීම.

- කැලණි විහාරයේ චෛත්‍යය හා එහි ජරාවාස වූ ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම.

- අභාවයට යමින් තිබූ උපසම්පදා මංගල්‍යය යළි පවත්වා සංඝ සංශෝධනයක් කිරීම.

- පරසතුරු ආක්‍රමණයේ දී විනාශ වූ බෞද්ධ පොතපත දැන උගත් ගිහි පඬිවරුන්ට මිල ගෙවා ඔවුන් ලවා ඒවා නැවත ලියවීම තුළින් භික්ෂූන් වහන්සේලාගේ ධර්ම ශාස්ත්‍රීය ඥානය නගා සිටුවීමට පියවර ගැනීම.


දඹදෙණියේ විජයසුන්දරාරාමය

මේ හැරුණු විට මායා රටට අයත් ප්‍රදේශවල කෘෂිකර්මය නගා සිටුවීම සඳහා අවශ්‍ය සම්පත් හා ආයුධ ශක්තිය මෙතුමා සතු නොවුණි. මේ වන විට මහලු වියේ පසු වූ මෙම රජුට එය බැරෑරුම් කාර්යක් වුවත් ඒ සඳහා අවශ්‍ය පසුබිම එතුමා විසින් සකස් කරන ලදී.මායා රට එක්සත් කළ ඔහු දඹදෙණිය , පර සතුරාට එරෙහිව නැඟී සිටීමේ මූලස්ථානය බවට පත් කළේ ය. මහලු වියේ දී රාජ්‍යය ලබා ගත් මෙතුමාගේ රාජ්‍ය කාලය අවුරුදු 4 කට (1232-1236) පමණක් සීමා විය. මෙතුමාගේ ඇවෑමෙන් පසු රජරට පරසතුරු ආධිපත්‍යයෙන් මුදවා ගැනීමේ භාරධූර කාර්යය පැවරුණේ ඔහුගේ ජ්‍යෙෂ්ඨ පුත් දෙවන පරාක්‍රමබාහු රජුට ය.

## දෙවන පරාක්‍රමබාහු රජු (ක්‍රි.ව 1236 - 1270)

දෙවන පරාක්‍රමබාහු රජු තුන්වන විජයබාහු රජුගේ පුත්‍රයා වන අතර ඔහු දඹදෙණිය තම රාජධානිය කරගත් දෙවැනියා ය. මෙතුමා පිළිබඳ හැදෑරීමට ඇති මූලාශ්‍රය අතර මහා වංශය , පූජාවලිය , දඹදෙණි අස්න , කඳවුරු සිරිත වැනි කෘති වැදගත් වේ. කුඩා කල සිට ම මෙතුමාට අධ්‍යාපනය ලබා දෙන ලද්දේ ශාසනානුශාසක ධූරය දැරූ සංඝරක්ඛිත මා හිමියන් ඇතුළු මහා සංඝයා වහන්සේ විසිනි. භාෂා සාහිත්‍යය , ආගම ,ධර්මය ආදියෙහි මනා නිපුණත්වයක් ලත් පරාක්‍රමබාහු කුමරු යථා කාලයේ දී මහා පඬිරුවනක් බවට පත් විය. මෙනිසා මෙතුමා " කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු" යන අන්වර්ථ නාමයෙන් ද හැඳින්විය.එමෙන් ම පණ්ඩිත පරාක්‍රමබාහු යන නමින් ද මෙතුමා හඳුන්වනු ලැබුණි. මෙතුමා විසින් සම්පාදනය කරන ලද ග්‍රන්ථ රාශියක් ම අද දක්වා ම ශේෂව පවතී.

දඹදෙණි යුගයේ සිටි ශ්‍රේෂ්ඨ ම පාලකයා වූ මෙතුමාගේ වැදගත්කම දේශපාලන , ආගමික , ශාස්ත්‍රීය හා අධ්‍යාපනික යන අංශ ඔස්සේ අධ්‍යයනය කළ හැකි ය.



අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- දිනුෂා හර්ෂණී මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂාව :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය. සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය -නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## දේශපාලන වැදගත්කම

### 1) චන්ද්‍රභානුගේ ප්‍රථම ආක්‍රමණය

බොහෝවිට අතීතයේ දී ලංකාවට ආක්‍රමණ එල්ල වූයේ දකුණු ඉන්දියානු රාජ්‍යවලිනි. නමුත් දෙවන පරාක්‍රමබාහු රජුට ප්‍රථම වරට අග්නිදිග ආසියාතික රටකින් මෙහෙයවනු ලැබූ ආක්‍රමණයකට මුහුණ දීමට සිදු විය.දෙවන පරාක්‍රමබාහු රජුගේ එකළොස්වන රාජ්‍ය වර්ෂයේ දී (ක්‍රි.ව. 1247) චන්ද්‍රභානු නමින් හැඳින්වෙන ජාවක රජෙකු ලංකාව ආක්‍රමණය කරන ලදී. ඔහු පැමිණියේ මලය අර්ධද්වීපයේ උතුරු කොටස එනම් තාම්‍රලිංග දේශයෙනි.තාම්‍රලිංග දේශය මෙකල බෞද්ධ රටක් වන අතර චන්ද්‍රභානු ද බෞද්ධයෙක් බව සඳහන් වේ. මේ අවධියේ පූජ්‍ය වස්තු පිළිබඳව ශ්‍රී ලංකාව අග්නිදිග ආසියාවේ බෞද්ධ රටවල්වල ඉමහත් ප්‍රසිද්ධියට ලක් විය.චන්ද්‍රභානු ලංකාව ආක්‍රමණය කළේ එවැනි පූජ්‍ය වස්තු ලබා ගැනීම සඳහා විය හැකි ය.

චන්ද්‍රභානුගේ පළමු ආක්‍රමණයේ දී ඔහුට එරෙහිව කරන ලද සටන මෙහෙයවන ලද්දේ දෙවන පරාක්‍රමබාහු රජුගේ බෑනා වූ වීරබාහු කුමරු විසිනි. පරාජයට පත් වූ චන්ද්‍රභානු පලවා හරින ලදී. චන්ද්‍රභානු පලවා හැරීමෙන් පසු වීරබාහු ආදිපාදයන් දෙවිනුවරට ගොස් පූජාවක් පැවැත්වූ බව සඳහන් වේ. ඒ නිසා චන්ද්‍රභානුගේ ආක්‍රමණය එල්ල වී ඇත්තේ දකුණු ප්‍රදේශයෙන් යැයි සිතේ. ඔහු දකුණු ලංකාවේ පිහිටි වරායකින් අප රටට ගොඩ බසින්නට ඇත.ප්‍රථම ආක්‍රමණයෙන් ලත් පරාජයෙන් පසු චන්ද්‍රභානු සිය රට බලා ගියේ ද නැතහොත් දිවයිනේ උතුරුකරයේ කිසියම් ප්‍රදේශයක රැඳී සිටියේ ද යන්න අවිනිශ්චිත ය.

මූලාශ්‍රගත තොරතුරුවලට අනුව නිගමනය කළ හැක්කේ චන්ද්‍රභානු සිය පරාජිත භට පිරිස් ද සමග යාපන අර්ධද්වීපයේ දේශපාලන බලයක් ගොඩනගා ගත් බව ය. යාපන අර්ධද්වීපයේ දක්නට ලැබෙන චාවකච්චේරි , චාවන්කොට්ටෙයි සහ යාපන අර්ධද්වීපයේ දකුණේ ඇති ජාවක කොට්ටෙයි වැනි නම් එම කාලයේ සිට පැවත එන බව විශ්වාස කෙරේ.

### 2) කාලිංස මාස පරාජය කිරීම

දෙවන පරාක්‍රමබාහු රජුගේ චාරිත්‍රානුකූල පූර්ණ රාජාභිෂේකය ලැබූ වසරේ සිට එනම් 1236 වසරේ සිට බලන විට බලහත්කාරයෙන් රජරට යටත් කරගෙන සිටි මාඝගේ රාජ්‍ය කාලය වසර 21 ක් බව වංශ කතාවල සඳහන් වේ.(1215-1236) මාඝ පරාජය කිරීමට මෙම රජුට හැකි වූයේ රාජ්‍යත්වයට පත් වී වසර දහනවයක් පමණ ඉක්ම ගිය පසුව ය.

මේවන විට මාඝ පොළොන්නරුව , ත්‍රිකුණාමලය , මහාතිත්ථ , කන්තලේ , ඌරාතොට (කයිට්ස්) ආදී ස්ථානවල බලකොටු ගොඩනංවා ඒවායේ කේරල භට සේනා රඳවා තිබුණි. කාලිංස මාඝගේ ප්‍රබල හමුදා ශක්තියට අභියෝග කිරීමට තරම් දෙවන පරාක්‍රමබාහු රජුගේ හමුදාව බලවත් නොවූ බැවින් මෙම සටනේ දී දකුණු ඉන්දියානු පාණ්ඩ්‍ය රාජ්‍යයේ රජ කළ ජටාවර්මන් සුන්දර පාණ්ඩ්‍ය රජුගෙන් යුද්ධ ආධාර ලබාගත් බව දකුණු ඉන්දීය සෙල්ලිපිවල සඳහන් වේ. එමෙන් ම තම සොහොයුරු බුවනෙකබාහුගේ සහ සෙන්පති වීරබාහු යන දෙදෙනාගේ නොමඳ සහාය ද ඇතිව පොළොන්නරුව නිදහස් කර ගැනීමේ සටන දියත් කළේ ය.

පාණ්ඩ්‍ය හා සිංහල සේනා එක්ව පොළොන්නරු බලකොටුව වට කර එල්ල කළ ප්‍රහාරවලින් මාඝගේ කේරල භට හමුදාවල විශාල පිරිසක් මරණයට පත්විය. පරාක්‍රමබාහු රජුගේ හමුදාවට හසු නොවී පණ බේරාගත් භට පිරිසක් බටහිර දෙසට පලා යද්දී කලා වැව අසල කඳවුරු බැඳගෙන සිටි සිංහල හමුදාව විසින් සමූලඝාතනය කරන ලද බව වංශ කථාවල සඳහන් වේ. දෙවන පරාක්‍රමබාහු කාලිංග මාඝට එරෙහිව දියත් කළ සටන ද පළමුවන විජයබාහු රජු සොළීන්ට එරෙහිව කළ සටන මෙන් ම සැලසුම් සහගතව දියත් කළ සටනක් බව පෙනේ.මෙම සටනින් පසුව කාලිංග මාඝ පලාගිය බවත් ඔහුගේ පලායාමෙන් පසු හතලිස් වසරක මාඝ පාලනය ක්‍රි.ව. 1255 දී පමණ නිම වූ බවත් නිගමනය වේ.

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- දිනුෂා හර්ෂණී මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂාව :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය. සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය -නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## 3) චන්ද්‍රභානුගේ දෙවන ආක්‍රමණය

පළමුව පරාජයට පත් වූ චන්ද්‍රභානු දකුණු ඉන්දියාවේ චෝල , පාණ්ඩ්‍ය රාජ්‍යවලින් රැස් කරගත් කුලී සේනාවක් ද සහිතව යළි ලංකාව ආක්‍රමණය කළේ ය. එම සේනාව කැටුව ලංකාවට පැමිණි චන්ද්‍රභානු දන්ත ධාතුව , පාත්‍රා ධාතුව හා ලංකා රාජ්‍යය ඔහුට ලබා දෙන ලෙස තර්ජනය කළේ ය.මොහු විසින් යාපහුව ආක්‍රමණය කරද්දී යාපහුවේ සිට ඇත්තේ විජයබාහු හා ඔහුගේ ඥාති සොහොයුරු වීරබාහු යි. ජටාවර්මන් වීර නම් පාණ්ඩ්‍ය රජු විසින් පිහිටුවන ලද කුඩුමියාමලෙයි සෙල් ලිපියේ සඳහන් පරිදි ලංකාවේ සිටි රජුන් දෙදෙනාගෙන් එක් අයෙකු සටන් බිමේ දී මරණයට පත් වී ඇත.

යාපහුව ප්‍රදේශයේ දී ඇති වූ සටන්වලින් චන්ද්‍රභානු මරණයට පත් වූ බව දකුණු ඉන්දියානු සෙල්ලිපි මඟින් සනාථ වෙයි. මෙම සටන්වල දී ජටාවර්මන් වීර පාණ්ඩ්‍ය රජුගේ උපකාරය දෙවන පරාක්‍රමබාහු රජුට ලැබී ඇත.එම උපකාරවලට හිලව් වශයෙන් පාණ්ඩ්‍ය අධිරාජ්‍යා විසින් චන්ද්‍රභානුගේ පුතෙක් උතුරු ලංකාවේ තම නියෝජිතයා ලෙස පත් කළ බව පාණ්ඩ්‍ය සෙල්ලිපිවල සඳහන් වේ. චන්ද්‍රභානුගේ දෙවන ආක්‍රමණය ක්‍රි.ව. 1261-1262 අතර කාලයේ සිදු වී ඇති බවද මෙම සෙල්ලිපිවල සඳහන් වේ.මෙම සටන්වලට උපකාර කළ පාණ්ඩ්‍ය රජුට දෙවන පරාක්‍රමබාහු රජු විසින් තෑගි භෝග ලබා දුන් බව ද මූලාශ්‍රයවල සඳහන් වේ.

දෙවන පරාක්‍රමබාහු රජු කාලිංස මාඝ පරදවා ලත් ජයග්‍රහණය අනුව මුළු ලංකාව ම ඔහු අතට පත් වුවත් ලංකාවේ උතුරු ප්‍රදේශය ( එනම් යාපන අර්ධද්වීපය හා උතුරු දෙසින් මන්නාරම දක්වාත් නැගෙනහිරින් මුලතිව් දක්වාත් වූ ප්‍රදේශය ) නැවත වරක් පාණ්ඩ්‍ය රජුගේ නියෝජිතයෙකු අතට පත් වීම නිසා තමන් ලත් ජයග්‍රහණය දෙවන පරාක්‍රමබාහු රජුට භුක්ති විඳීමට හැකි වූයේ කෙටි කලක් පමණි. නමුත් ,අනුරාධපුරය , පොළොන්නරුව , ත්‍රිකුණාමලය ආදී බොහෝ ප්‍රදේශ සිංහල රජුගේ පාලනයට යටත් වීම නිසා දෙවන පරාක්‍රමබාහු රජුගේ සටන් ව්‍යාපාරයෙන් ලැබුණු ජයග්‍රහණය ඉතා වැදගත් වේ.

ජයග්‍රහණයෙන් පසු මෙතුමා පොළොන්නරුවට ගොස් එහිදී නැවත රාජාභිෂේකයක් පැවැත්විය. නමුත් පොළොන්නරුවේ වැඩි කලක් වාසය නොකළ අතර සිය බෑනා වූ වීරබාහුට පොළොන්නරුව බාර දී ආපසු දඹදෙණියට පැමිණි බව පෙනේ.

රාජ්‍යත්වයට පත් වී වසර තිහකට ආසන්න කාලයක් තුළ සතුරන්ට එරෙහිව සටන් කරමින් වුවද එතුමා විසින් කරන ලද ආගමික හා සාහිත්‍ය සේවාවන් රැසකි.

### ආගමික සේවය

- බෙලිගල සිට දඹදෙණියට දළදා වහන්සේ වැඩමවීම සහ ජනතාවට දුන් පොරොන්දුව අනුව කාලිංස මාඝ පරාජය කිරීමෙන් පසු දළදා ප්‍රදර්ශනයක් පැවැත්වීම.

- ශාසන සංශෝධනයක් ඇති කොට සංඝ සමාජය ක්‍රමවත් කිරීම.

දිඹුලාගල මේධංකර වැනි මහ නා හිමිවරුන්ගේ මූලිකත්වයෙන් ශාසන ශෝධනයක් ඇති කොට භික්ෂූන් වහන්සේලාගේ යහ පැවැත්මට අදාළ නීති රීති ඇතුළත් කතිකාවක් සකස් කිරීම. දඹදෙණි කතිකාවත යනුවෙන් එය හැඳින්වේ. එහි ඇතුළත් භික්ෂූන් වහන්සේලා විසින් ප්‍රගුණ කළ යුතු විනය නීතිවලට උදාහරණ ලෙස ,

1.) භික්ෂූන් විසින් නැකත් බැලීම , බිලි පූජා පැවත්වීම නොකළ යුතු ය.
2.) ලාභ අපේක්ෂාවෙන් (මිල මුදල් හෝ ගුරු පඬුරු) ගිහියන්ට සේවය නොකළ යුතු ය.

- තම පුත් විජයබාහු කුමරුගේ අධීක්ෂණය යටතේ රුවන්වැලි සෑය ඇතුළු වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කරවීම.

මෙම ප්‍රතිසංස්කරණවලින් පසු අනුරාධපුර නගරයේ නඩත්තුව හා ආරක්ෂාව වන්නි ප්‍රධානීන්ට පවරන ලදී.පොළොන්නරු නගරය ද ප්‍රතිසංස්කරණය කරන ලදී.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

- මහවැලි ගඟේ දාස්තොට දී උපසම්පදා උත්සවයක් පැවැත්වීම.
- තාම්‍රලිංග දේශයෙන් ධර්ම කීර්ති මහ ස්ථවිරයන් මෙරටට වැඩම කොට උන් වහන්සේගේ අනුශාසනා යටතේ වනවාසී භික්ෂු පරම්පරාව මෙරට පිහිටුවීම.
- කැලණි විහාරය , බෙන්තොට විහාරය , ගලපාත විහාරය ,බෙලිගල විහාරය , වාකිරිල විහාරය හා දෙවිනුවර උපුල්වන් දේවාලය ඉදි කිරීම.
- විවිධ ස්ථානවල පිරිවෙන් පිහිටුවීම හා භික්ෂු අධ්‍යාපනයේ දියුණුවට කටයුතු කිරීම.
- රත්නපුර මහ සමන් දේවාලය ඉදි කිරීම.
- වාර්ෂිකව කඨින පූජෝත්සව පැවැත්වීම හා පෙරහැර ආදිය (බෙන්තර පෙරහැර , ඇසළ පෙරහැර) පැවැත්වීමට අනුග්‍රහ ලබාදීම.
- මාඝ විසින් පැහැර ගන්නා ලද විහාර දේපළ එම විහාරවලට ලබා දීම.

## 2. ආගමික හා ශාස්ත්‍රීය සේවය

- පිරිවෙන් ඉදි කිරීම හා ඒවා ශාස්ත්‍රීය මධ්‍යස්ථාන බවට පත් කිරීම.

  උදා :- නන්දන පිරිවෙන , කුරුණෑල මහේන්ද්‍ර පිරිවෙන , පරාක්‍රම පිරිවෙන , පළාබද්දල , වාකිරිගල , දඹදෙණිය විජේසුන්දරාරාමය

- විදේශ රටවලින් ත්‍රිපිටකධාරී භික්ෂූන් ගෙන්වා පාලි සාහිත්‍යයේ උන්නතියට කටයුතු කිරීම.
- රජු උගත් පඬිවරයෙකු වීම නිසා ග්‍රන්ථ රචනයෙහි නියැලීම, මෙතුමා ලියූ පොත් ලෙස විසුද්ධි මග්ග සන්නය , වන විනිස සන්නය , කව් සිළුමිණ හැඳින්වේ.මෙතුමා කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන උපාධි නාමයෙන්ද පිදුම් ලබා ඇත.
- ග්‍රන්ථකරණයට අනුග්‍රහ දැක්වීම . මේ නිසා සිංහල , පාලි සංස්කෘත ආදී භාෂාවන්ගෙන් විවිධ ක්ෂේත්‍ර අළලා ග්‍රන්ථ සම්පාදනය වීම.





Copyright © www.e-thaksalawa.moe.gov.lk

## දඹදෙණි යුගයේ අධ්‍යාපනය හා සාහිත්‍යය

### අධ්‍යාපනය

දඹදෙණි යුගයේ අධ්‍යාපනය පිළිබඳව සැලකීමේ දී 12 වන සියවසේ පැවති අෂ්ට මූලායතනවලට සමානව මෙම යුගයේ පැවති පංචමූල පිරිවෙන් නැමති අධ්‍යාපන ආයතන පිළිබඳව මූලාශ්‍රයවලින් තොරතුරු ලැබේ. මයුරපාද පිරිවෙන හා දේවපතිරාජ පිරිවෙන මෙම යුගයේ පැවති දීප්තිමත් අධ්‍යාපන මධ්‍යස්ථාන දෙකකි.

### සාහිත්‍යය

දඹදෙණි රාජධානිය ආරම්භ කළ තුන්වන විජයබාහු රජතුමා කාලිංග මාඝගේ ආක්‍රමණය නිසා පිරිහී ගිය සිංහල සංස්කෘතියට පුනර්ජීවනයක් ලබා දීම සඳහා විශාල වෙහෙසක් දරා ඇති බව පෙනේ. එතුමා පොළොන්නරුව හැර දැමා ආරක්ෂිත ස්ථානවලට පැන ගොස් සිටි භික්ෂූන් වහන්සේලා දඹදෙණියට වැඩම කරවා බුදු සසුනේ දියුණුව මෙන්ම ශාස්ත්‍රීය දියුණුවට රාජ්‍ය අනුග්‍රහය ලබා දුන් අතර ඒ වන විට ඉතිරිව තිබූ පැරණි පොත් පත් ලියවීමට විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලදී.



දෙවන පරාක්‍රමබාහු රජ දවස සංඝරාජ ධූරය දැරූ සංඝරක්ඛිත නා හිමියන් දඹදෙණි යුගයේ විසූ අග්‍රගණ්‍යය පඬිරුවනකි.උන් වහන්සේ දිඹුලාගල ආරණ්‍යවාසී මේධංකර හිමියන් හා එක්ව තුන්වන විජයබාහු රජුගේ අනුග්‍රහය ඇතිව සම්පාදනය කල දඹදෙණි කතිකාවත දෙවන පරාක්‍රමබාහු රජු විසින් නැවත සංශෝධනය කොට සෙල් ලිපියක් ලෙස පිහිටුවන ලදී. දඹදෙණි යුගයේ සාහිත්‍යකරණයේ යෙදුන උගත් භික්ෂූන් වහන්සේලා බොහෝ දෙනෙක් පොළොන්නරු යුගයේ වැඩවිසූ ටීකාචාර්ය සාරිපුත්ත මහනාහිමියන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට අයත් වූහ. මේ නිසා මෙම යුගයේදී විශාල සාහිත්‍ය කෘති ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය වංශයට එක් විය.







අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- දිනුෂා හර්ෂණි මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂාව :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය. සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය -නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# සිංහල භාෂාවෙන් රචිත සාහිත්‍ය ග්‍රන්ථ

## සද්ධර්මරත්නාවලිය


පාලිධම්මපදට්ඨකථාව ඇසුරින් ලියා ඇත. ජනවහර යොදා ගෙන සරල බසින් රචනා කර ඇති මෙහි සිත්ගන්නාසුලු උපමා දක්නට ලැබේ.


කර්තෘ :- ධර්මසේන හිමි

## පූජාවලිය

අරහං බුදු ගුණය විස්තර කරමින් ලියා ඇත.තත්කාලීන භාෂා ව්‍යවහාරය හා සමාජ තත්ත්වය පිළිබඳ තොරතුරු ලබාගත හැකි වටිනා ඓතිහාසික මූලාශ්‍රයකි.

කර්තෘ :- මයුරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමි




## කව් සිළුමිණ

සිංහල පද්‍ය සාහිත්‍යයේ මුදුන් මල්කඩ ලෙස සැලකෙන මෙම කෘතිය සිංහල සාහිත්‍ය වංශයේ දක්නට ලැබෙන පැරණි ම මහා කාව්‍ය ග්‍රන්ථය යි." කුස ජාතකය " පදනම් කරගෙන ලියා ඇති මෙම කෘතිය මඟින් ලේඛකයාගේ ප්‍රතිභාපූර්ණ කවිත්වය මැනවින් පිළිබිඹු වේ.

කර්තෘ :- සකල විද්‍යා චක්‍රවර්තී දෙවන පරාක්‍රමබාහු රජු

## විසුද්ධි මාර්ග සන්නය

විසුද්ධි මාර්ගයට ලියන ලද ගැටපද විවරණයකි.මෙය ථේරවාදී බෞද්ධ දර්ශනය පිළිබඳව කෝෂ ග්‍රන්ථයක් ලෙස ප්‍රසිද්ධ ය.බුදු දහම පිළිබඳව කතුවරයා සතු දැනුම් සම්භාරය මෙම ග්‍රන්ථයෙන් පෙන්නුම් කෙරේ.

කර්තෘ : - දෙවන පරාක්‍රමබාහු රජු

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- දිනූෂා හර්ෂණී මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂාව :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය. සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය -නුගේගොඩ

**සිදත් සඟරාව**
සිංහල භාෂාවේ ව්‍යාකරණ විධි 20 ක් විස්තර කරමින් ලියා ඇති මෙම කෘතිය සිංහල භාෂාව පිළිබඳව ලියවී ඇති පැරණි ම ව්‍යාකරණ ග්‍රන්ථය වේ.


කර්තෘ :- මයුරපාද පරිවේණාධිපති වෛදේහ හිමි

**එළු සඳැස් ලකුණ**
හෙළ බසින් කාව්‍ය නිර්මාණය සඳහා වැදගත් වන ඡන්දස් අලංකාර පිළිබඳ විස්තර ඇතුළත් කොට ලියා ඇති මෙම කෘතිය මඟින් සිංහල කාව්‍ය ශාස්ත්‍රයේ දියුණුවට විශාල මෙහෙයක් ඉටුකොට ඇත.

කර්තෘ :- හඳු හිමි

**උම්මග්ග ජාතකය**
බෝසත් මහෞෂධ පඬිවරයාගේ බුද්ධි මහිමය විස්තර කිරීම සඳහා ලියා ඇති ග්‍රන්ථයකි.මෙය අතුරු කථා රාශියකින් සමන්විත වන අතර තත් කාලීන සමාජ තොරතුරු ලබා ගැනීම සඳහා ඉතා ප්‍රයෝජනවත් මූලාශ්‍රයකි.

කර්තෘ :- වීරසිංහ ප්‍රතිරාජ




**රසවාහිනිය**
ලංකාවේ පුරාණ ජනකතා ඇසුරින් පාලි භාෂාවෙන් රචනා කර තිබූ සහස්ස වත්ථුපකරණය නමැති ග්‍රන්ථය ඇසුරින් ලියා ඇත.

කර්තෘ :- වෛදේහ හිමි

**සමන්ත කූඨ වර්ණනා**
ශ්‍රී පාදස්ථානය ඇසුරින් ගොඩ නැගී තිබූ කථා ප්‍රවෘත්ති පදනම් කරගෙන ලියා ඇත.

කර්තෘ:- වෛදේහ හිමි

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- දිනුෂා හර්ෂණී මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂාව :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය. සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය -නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

**දඹදෙණි කතිකාවත**
භික්ෂූන් වහන්සේලා විසින් පිළිපැදිය යුතු විනය නීති සංග්‍රහයකි.

කර්තෘ :-
දෙවන
පරාක්‍රමබාහු රජු.

**භේසජ්ජ මංජුසාව**
මෙය වෛද්‍ය ග්‍රන්ථයකි.

කර්තෘ :-
පංචමූල
පරිවේනාධිපති
නා හිමි

**හත්ථවනගල්ල විහාර වංශය**
මෙහි අත්තනගල්ල විහාරයේ ඉතිහාසය ඇතුළත් වේ.

කර්තෘ :-
අනෝමදස්සි
හිමිගේ ඉල්ලීම
පරිදි ශිෂ්‍ය භික්ෂූන්
විසින් ගද්‍ය හා පද්‍ය
මිශ්‍ර බසින් ලියා
ඇත.

**දෛවඥ කාම ධේනු**
මෙය ජ්‍යොතිෂ ග්‍රන්ථයකි.

කර්තෘ :-
අනෝමදස්සී
හිමි

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- දිනුෂා හර්ෂණි මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂාව :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය. සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය -නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

දෙවන පරාක්‍රමබාහු රජුගේ අවසාන කාලයේ දී එතුමා රෝගාතුර වීම නිසා රාජ්‍ය පාලන කටයුතු ඔහුගේ වැඩිමහල් පුත්‍රයා වූ විජයබාහු කුමරුට පවරන ලදී. ක්‍රි.ව. 1271 දී දෙවන පරාක්‍රමබාහු රජු මිය ගිය බැවින් එවකට රාජ්‍ය කටයුතු මෙහෙයවන ලද විජයබාහු කුමරු හතරවන විජයබාහු හෙවත් බෝසත් විජයබාහු නමින් දඹදෙණියේ රජ විය. රජරට ශිෂ්ටාචාරයේ සිට ම සිංහල රජවරු තම ආරක්ෂාව පිණිස අගම්පඩි හමුදාවක් තබා ගත් බව පෙනේ. ඒ අනුව යමින් දඹදෙණියේ රජවරුන් ද තම පෞද්ගලික ආරක්ෂාව සඳහා අගම්පඩි හමුදාවක් තබා ගෙන ඇත. ඒ අනුව දඹදෙණි රජවරුන්ට ඉතා භක්තිමත්ව සේවය කළ "රාජපුත් " හමුදාවක් විය .

හතරවන විජයබාහු රජුට (බෝසත් විජයබාහු ) රජකම් කළ හැකි වූයේ වසර දෙකකට අඩු කාලයකි. ක්‍රි.ව. 1272 දී මිත්ත නම් සෙන්පතියෙකු රජ මාලිගයේ සේවකයෙකුට අල්ලස් දී ඔහු ලවා රජු මරවා රජකම පැහැර ගත්තේ ය. රජකමට උරුමයක් නොතිබූ මිත්ත තම බලය තහවුරු කර ගැනීම සඳහා වැඩි වැටුප් හා ප්‍රසාද දී හමුදා ප්‍රධානීන් තමාට පක්ෂපාත කරවා ගෙන බෝසත් විජයබාහු රජුගේ සහෝදරයා වූ බුවනෙකබාහු ආදිපාද මරවා දැමීමට චර පුරුෂයන් යෙදවීය. බුවනෙකබාහු ආදිපාදවරයා සතුරන්ගෙන් බේරී යාපහුවට පලා ගියේ ය. බෝසත් විජයබාහු රජුට ඉතා හිතවත්ව සිටි රාජපුත් භටයෝ නීති විරෝධී ලෙස රාජ්‍ය පැහැර ගත් මිත්ත සෙනවියාට අවනත නොවිණි. අගම්පඩි සේනාවේ ප්‍රධානියා වූ ඨකුරක සෙන්පතියාට වැටුප් හා වරප්‍රසාද ලබා දීම සඳහා රජ මාලිගයට කැඳවූ අවස්ථාවේ දී ඔහු තම සේනාව මෙහෙයවා මිත්ත සෙනවි මරා දමන ලදී. තමා එසේ කළේ නීත්‍යානුකූල රාජ්‍යය උරුම වූ බුවනෙකබාහු ආදිපාදවරයාගේ උපදෙස් මත බව දේශීය හමුදා ප්‍රධානීන්ට පැහැදිලි කර දුන් ඨකුරක ඔවුන් ද පක්ෂපාතී කරවා ගෙන යාපහුවේ සිට බුවනෙකබාහු ආදිපාදවරයා කැඳවා ගෙන විත් ක්‍රි.ව 1272 දී ඔහු දඹදෙණියේ රජු බවට පත් කරන ලදී.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- දිනුෂා හර්ෂණි මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂාව :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය. සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය -නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk